රහස්‍ය ලේඛනයකි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

අ.පොස. (සා.පෙළ) විභාගය - 2015

11 - බුද්ධ ධර්මය

ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
පරීක්ෂක සාකච්ඡා පැවැත්වෙන අවස්ථාවේදී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

න් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

සියලුම හිමිකම් ඇවිරිණි.

Scanned with CamScanner

උත්තරපත්‍ර ලකුණු කිරීම - පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතු වේ. ඒ සඳහා පහත පරිදි කටයුතු කරන්න.

- උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
- සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න. ඉලක්කම් ලිවීමේ දී **පැහැදිලි ඉලක්කමින්** ලියන්න.
- ඉලක්කම් ලිවීමේ දී වැරදුණු අවස්ථාවක් වේ නම් එය පැහැදිලි ව තනි ඉරකින් කපා හැර නැවත ලියා කෙටි අත්සන යොදන්න.

බහුවරණ උත්තරපත්‍ර (කවුළු පත්‍රය)

ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදි ව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන/අතිරේක ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.

අනතුරු ව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එක ම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අදින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා වෙනත් පිළිතුරක් ලකුණු කර තිබෙන්නට පුළුවන. එසේ මකන ලද අවස්ථාවක දී පැහැදිලි ව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අදින්න.

කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදි ව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර × ලකුණකින් ද වරණ තීරය අවසානයේ ලකුණු කරන්න. නිවැරදි ලකුණු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරය පහළින් ලියා දක්වන්න. අනතුරු ව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න. ලකුණු පරිවර්තනය කළ යුතු අවස්ථාවල දී පරිවර්තිත ලකුණු ලියා ඒ වටා රවුමක් අඳින්න.

උදා : $\frac{60}{100}$ $\frac{20}{30}$

ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර

- අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස් ව තබා ඇති කොටස් පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි අඳින්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.
- ලකුණු සටහන් කිරීමේ දී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

කිසියම් අයදුම්කරුවකු විෂයයට නියමිත ප්‍රශ්නපත්‍ර එකකට පමණක් පෙනී සිටි අවස්ථාවක දී (ප්‍රශ්නපත්‍ර කුනක් ඇති විෂයයන් හි එකකට හෝ දෙකකට) ඉතිරි ප්‍රශ්නපත්‍රයට හෝ ප්‍රශ්න පත්‍රවලට ඔහු නොපැමිණි බව විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන්ව තිබේ නම්, නොපැමිණි පත්‍රවලට අයදුම්කරු ලබා ඇති ලකුණු 00 ක් සේ සලකා එම අයදුම්කරුගේ අවසාන ලකුණු තීරණය කළ යුතු ය.

Scanned with CamScanner

උදාහරණ : මුළු ලකුණු 100

අවසාන ලකුණු 100	මුළු ලකුණු 100	I පත්‍රය 40	II පත්‍රය 60
44	44	AB	44

අවසාන ලකුණු 100	මුළු ලකුණු 200	I පත්‍රය 100	II පත්‍රය 100
31	62	62	AB

අවසාන ලකුණු තීරණය කළ නොහැකි අවස්ථා

* කිසියම් විභාග මධ්‍යස්ථානයකට අයත් ඔබ ලකුණු කරන විෂයයේ I හෝ II උත්තරපත්‍ර පැකැට්ටුවලින් එක් පැකැට්ටුවක් ඔබ මණ්ඩලය වෙත ලැබී නොමැති නම් අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

  (උදා - ගණිතය විෂයය සඳහා ගණිතය I හා II වශයෙන් ප්‍රශ්න පත්‍ර දෙකක් තිබේ. එහෙත් අංක 10 දරන විභාග මධ්‍යස්ථානයෙන් ඔබ මණ්ඩලය වෙත ලැබී ඇත්තේ ගණිතය II උත්තර පත්‍ර පැකට්ටුව පමණි.)

* කිසියම් අයදුම්කරුවකුගේ I හෝ II හෝ III හෝ උත්තරපත්‍රවලින් 01 ක් හෝ 02 ක් හෝ පැකැට්ටුව තුළ නොමැති අවස්ථාවක දී, ඔහු එම ප්‍රශ්න පත්‍රයට හෝ පත්‍රවලට නොපැමිණි බව ශාලාධිපති විසින් විස්තර ලකුණු ලැයිස්තුවේ සටහන් කර නොමැති අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

* කිසියම් අයදුම්කරුවකුගේ උත්තරපත්‍රයේ සඳහන් විභාග අංකය හා ලකුණු ලැයිස්තුවේ සඳහන් විභාග අංකය නොසැසඳෙන අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

* කිසියම් මධ්‍යස්ථානයක සියලු ම අයදුම්කරුවන්ට පොදු වශයෙන් බලපා ඇති වරදක් සිදු වී ඇති අවස්ථාවක දී ද අවසාන ලකුණු තීරණය කළ නොහැකි ය.

  උදා - ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන, කඩදාසි දෙකකින් හෝ කිහිපයකින් සමන්විත ප්‍රශ්න පත්‍රයක් ඇති අවස්ථාවක විභාග අපේක්ෂකයින්ට එක් කඩදාසියක් හෝ කිහිපයක් අඩුවෙන් දී ඇති අවස්ථා

මෙවැනි අවස්ථාවල දී

අවසාන ලකුණු තීරණය නොකර ලකුණු ලැයිස්තුවේ වෙනත් කරුණු තීරයේ අයදුම්කරුගේ විභාග අංකය ලියා **"අවසාන ලකුණු තීරණය කළ නොහැක"** යන සටහන යොදන්න. මෙම සටහන උත්තරපත්‍රයේ මුල් පිටුවේ පහළ කෙළවරේ ද යොදන්න. මේ පිළිබඳ ව ජර්නල් සටහනක් යොදන්න.

මෙවැනි අයදුම්කරුවන් පිළිබඳ මධ්‍යස්ථාන අනුව වෙන් වශයෙන් (9IML) අසම්පූර්ණ ලකුණු ලැයිස්තු පිළියෙල කරන්න.

මෙම ලකුණු ලැයිස්තු 9IML කවරය තුළ බහා ඇගයීම් මධ්‍යස්ථාන පරිපාලකට භාර දෙන්න.

එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.

ප්‍රශ්න අංක 03 - (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ = $\boxed{\frac{10}{15}}$

Scanned with CamScanner

සෑම ප්‍රශ්නයකට ම දෙන මූළු ලකුණු උත්තරපත්‍රයේ මූල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් අංක දෙකකින් ලියා දක්වන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතු වේ. කියල්ල ම ලකුණු කොට ලකුණු මූල් පිටුවේ සටහන්කර අවසානයේ දී ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනි ව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු ලබන පිළිතුරු කපා ඉවත් කරන්න.

පරීක්ෂකවරු ව මූළු ලකුණු ගණන එකතු කොට මූල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකට ම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ගණන ඔබ විසින් මූල් පිටුවේ එකතු කර ඇති මූළු ගණනට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න. ඒ ඒ ප්‍රශ්න පත්‍රයට ලබා ඇති ලකුණු ප්‍රතිශතයක් වශයෙන් දැක්විය යුතු අවස්ථාවල දී එසේ දක්වන්න.
(ඇතැම් ප්‍රශ්න පත්‍රවලට නියමිත ලකුණු ගණන හා ප්‍රතිශතය සමාන වන අතර, ඇතැම් ඒවායේ නියමිත ලකුණු හා ප්‍රතිශතය වෙනස් වේ.)

අවසාන ලකුණු තීරණය කිරීම

දින පැකැට්ටුවට අදාළ සියලු ම උත්තරපත්‍ර එනම් I හා II (ඇත්නම් III) උත්තර පත්‍ර ලකුණු කර අවසාන වූ පසු එම උත්තරපත්‍රවලට අදාළ ලකුණු අයදුම්කරුගේ II පත්‍රයේ මූල් පිටුවේ සටහන් කරන්න.

උදාහරණ :

(අ)	(ආ)	(ඉ)
(i) $\frac{54}{100}$	(i) $\frac{22}{40}$	(i) $\frac{60.5}{100}$
(ii) $\frac{67}{100}$	(i) $\frac{34}{60}$	(i) $\frac{81}{100}$
(iii) $\frac{36}{100}$		
3 ⟌ 157		2 ⟌ 141.5
52.33		70.75
52%	56%	71%

ඉහත උදාහරණවලින් දැක්වෙන පරිදි දශම සංඛ්‍යා ලැබෙන අවස්ථාවල දී අවසාන ලකුණු පමණක් පූර්ණ සංඛ්‍යාවක් ලෙස දක්වන්න. අවසාන ලකුණු ප්‍රතිශතයක් වශයෙන් පූර්ණ සංඛ්‍යාවක් ලෙස දැක්වීමේ දී ඉතිරිය 0.5 හෝ ඊට වැඩි නම් ඊළඟ පූර්ණ සංඛ්‍යාවට පැමිණවිය යුතු ය. ඉතිරිය 0.5ට අඩුනම් නොසලකා හැරිය යුතු ය. අවසාන ලකුණු ලෙස සැලකෙන්නේ එක් එක් අයදුම්කරුවන් එම විෂයයේ සෑම ප්‍රශ්න පත්‍රයකට ම ලබා ඇති ලකුණුවල ප්‍රතිශතයයි. අවසාන ලකුණු II පත්‍රය මත අකුරින් ද ලියා දක්වන්න.

Scanned with CamScanner

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
අ.පොෂ.ස. (සා.පෙළ) විභාගය - 2015

11 - බුද්ධ ධර්මය

සවිස්තර ලකුණු දීමේ පටිපාටිය

බුද්ධ ධර්මය විෂයය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වෙයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ මෙම ප්‍රශ්න පත්‍ර සැකසී ඇත. නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රියාවලියකට සිසුන් යොමු කිරීම නව විෂයමාලා ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂික විය. නිපුණතාවක් (Competency) යනු දැනුම (Knowledge) ආකල්ප (Attitude) කුසලතා (Skills) සහ යහ පුරුදු (Good Practices) යන මේවායේ සමස්ත එකතුවේ ප්‍රතිඵලය වෙයි. දිගුකාලීනව ලැබූ ඉගෙනුම් ක්‍රියාවලියේ අවසාන ඵලය නිපුණතාවයන්ගෙන් පිරි සමබර පෞරුෂයෙන් යුතු යහපත් පුරවැසියන් වේ. බුද්ධ ධර්මය විෂයය න්‍යායාත්මකව සහ ප්‍රායෝගිකව හැදෑරීම තුළින් ආගම විෂයයට අදාළ නිපුණතා ශිෂ්‍යයා සපුරා ගෙන ඇත යනු අපගේ විශ්වාසයයි. ඇගයීම් ක්‍රියාවලිය ද නිපුණතා පාදකව සිදුකරලීම සඳහා ප්‍රයත්න දරා ඇත. අදාළ නිපුණතාව ශිෂ්‍යයා අත්කර ගෙන තිබේද යන්න මැන බැලීමට උචිත අයුරින් බොහොමයක් වණු සැකසී ඇති බව සිහියේ තබාගත යුතුය.

මෙම විෂයය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වෙයි. පළමුවැන්න බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. දෙවැන්න කෙටි පිළිතුරු සැපයීමේ හා ව්‍යුහගත රචනා වර්ගයේ ප්‍රශ්න වලින් යුක්තය. මෙම ප්‍රශ්න පත්‍ර සඳහා ලකුණු වෙන් කොට ඇත්තේ මතු දැක්වෙන පරිදි වේ.

I - පත්‍රය ලකුණු 40 යි

II - පත්‍රය ලකුණු 60 යි

මුළු ලකුණු 100 යි

බුද්ධ ධර්මය - I

01. අධ්‍යාපන ක්‍රියා පද්ධතිය මගින් ශිෂ්‍ය - ශිෂ්‍යාවන් තුළ දැනුම ආකල්ප හා කුසලතා ප්‍රවර්ධනය කිරීම මූලික අභිමතාර්ථය වෙයි. හුදු දැනුම පමණක් යහපත් ශිෂ්ට සම්පන්න පුරවැසියකු බිහි කිරීමට ප්‍රමාණවත් නොවේ. අංග සම්පූර්ණ පුරවැසියකු වීමට යහපත් ආකල්ප පෝෂණයක් ද තදනුබද්ධව සංවර්ධනය විය යුතු පුද්ගල කෞශල්‍යය ද අත්‍යාවශ්‍ය වෙයි. බුද්ධ ධර්මය විෂයය නිර්දේශය සැකසී ඇත්තේ දැනුම, අකල්ප හා කුසලතා වර්ධනය සඳහාය. ඒ සඳහා බුද්ධ ධර්මය පාඨ්‍යග්‍රන්ථ මගින් විශාල ප්‍රයත්නයක් දරා ඇති අතර, ආකල්ප හා කුසලතා වර්ධනය විෂයය භාර ගුරු මහත්ම මහත්මීන්ගේ දායකත්වය මගින් පෝෂණය කිරීම අපේක්ෂිතය බුද්ධ ධර්මය ආගමික විෂයය නිර්දේශයක් වුවද එමගින් හුදු දැනුම පමණක් මණිනු නොලැබේ. ප්‍රශ්න සැකසී ඇත්තේ දැනුම, ආකල්ප සහ කුසලතා විනිශ්චය කිරීම සඳහාය.

02. ප්‍රශ්න හතලිහකින් යුත් පළමුවැනි ප්‍රශ්න පත්‍රය සඳහා වෙන්ව ඇති කාලය පැයකි. ප්‍රශ්න පත්‍රයේම දැක්වෙන පිළිතුරු හතරකින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ලකුණු කිරීම විභාග අපේක්ෂකයා විසින් කළ යුතුය.

Scanned with CamScanner

03. ප්‍රශ්නයට අදාළ පිළිතුර සේ පෙනෙන එහෙත් නිවැරදි පිළිතුරු නොවන පිළිතුරු තුනක් තිබේ. දී ඇති පිළිතුරු සටහනින් නිවැරදි පිළිතුර තෝරා ගැනීම සඳහා බුද්ධ ධර්මය මැනවින් හදාරා තිබිය යුතුය.

04. අසා ඇති ප්‍රශ්න වහා අවබෝධකර ගැනීමේ ශක්තිය විභාග අපේක්ෂකයා සතු විය යුතුය. ප්‍රශ්නය නිසි ලෙස තේරුම් නොගැනීම අසාර්ථක පිළිතුරක් සැපයීමට හේතු විය හැකිය. ප්‍රශ්නය නිවැරදිව තේරුම් ගැනීමෙන් පසු නොපමාව නිවැරදි පිළිතුර කුමක් දැයි හඳුනාගෙන ලකුණු කළ යුතුයි.

05. පැයක පමණ කෙටි කාලයක් තුළ මේ සියලු කාර්යයන් ඉටු කළ යුතුව ඇති බැවින් ප්‍රශ්න පිළිබඳව නිරවුල් අවබෝධ ඥානය හා කාර්යක්ෂමභාවය සාර්ථක පිළිතුරු සැපයීමට බෙහෙවින් උපකාරවත් වේ.

06. සරල ප්‍රශ්න හතළිහකින් යුත් මේ ප්‍රශ්න පත්‍රයෙන් බලාපොරොත්තු වන්නේ බුද්ධ ධර්මය විෂයය සම්බන්ධ සාමාන්‍ය දැනීම පරීක්ෂාකර බැලීමය.

07. මේ ප්‍රශ්න පත්‍රයේ පිළිතුරුපත් ලකුණු කිරීමට පළමු පහත සඳහන් කරුණු කෙරෙහි පරීක්ෂකවරුන්ගේ දැඩි අවධානය යොමුවිය යුතුය.

i. නිවැරදි වරණය තේරීමේ දී අපේක්ෂකයා ලකුණු කොට ඇත්තේ එක් වරණයක් පමණක් දැයි බලන්න. එක් වරණයකට වඩා වැඩි සංඛ්‍යාවක් ලකුණු කොට ඇත්නම් එම පිළිතුර ඉරක් ඇඳ කපා හරින්න.

ii. සිදුරුපත් භාවිතා කරන පරීක්ෂකවරුන් ප්‍රශ්නයේ අංකයත්, නිවැරදි පිළිතුරත් පැහැදිලිව පෙනෙන සේ සිය සිදුරුපත සකස්කර ගත යුතුය.

iii. සිදුරුපත් මගින් හරි වැරදි ලකුණු කිරීමේ දී නිවැරදි වරණය සඳහන් කොටුව මත ලකුණු කිරීමෙන් වලකින්න. පිළිතුරට අදාළ ප්‍රශ්න අංකය ඉදිරියෙහි හරි වැරදි ලකුණු කරන්න.

iv. නිවැරදි ලකුණු සංඛ්‍යාව ගණනය කොට අදාළ පේළිය යට මුළු සංඛ්‍යාව සටහන් කරන්න.

08. බුද්ධ ධර්මය ප්‍රශ්න පත්‍රයට අදාළ නිවැරදි උත්තර මතු දැක්වෙන සටහනෙහි පළවෙයි. නිවැරදි උත්තරයට එක් (01) ලකුණක් බැගින් හිමිවේ.

Scanned with CamScanner

බුද්ධ ධර්මය II

01. නව අධ්‍යාපන විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ විභාගය පැවැත්විණි. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නිපුණතා පාදකව (Competency Based) ක්‍රියාකාරකම් පාදකව (Activity Based) සිදුවන අතරම ඇගයීම් හා තක්සේරුකරණ ක්‍රියාවලියද නිපුණතා පාදකව නිර්ණායක මූලිකව (Competency Based Criterion Reference Assessment and Evaluation) සිදුකිරීමට ප්‍රයත්න දරා ඇත. නිපුණතාවක් දැනුම ආකල්ප කුසලතා හා යහපුරුදු වලින් යුක්ත වෙයි. නිපුණතාවයක් දිගුකාලීනව ඇතිවන්කි. ආගම හා සදාචාරයට අදාළ නිපුණතාවන් මෙන්ම බුද්ධ ධර්මය විෂයානුබද්ධ නිපුණතාවයන් ශිෂ්‍යයා ලබාගෙන තිබේද යන්න මැන බැලීම සඳහා ප්‍රශ්න පත්‍රය සැකසී ඇත.

බුද්ධ ධර්මය විෂය ක්ෂේත්‍රය පිළිබඳ අපේක්ෂකයා තුළ නිවැරදි අවබෝධය හා විෂය කරුණු විස්තරාත්මකව ඉදිරිපත් කිරීමේ හැකියාවද, තමන් උගත් විෂය කරුණු ජීවිතය හා සමාජය සම්බන්ධ කොට විශ්ලේෂණය කිරීම සම්බන්ධයෙන් දක්වන නිපුණතාද විමසා බැලීමේ මේ ප්‍රශ්න පත්‍රයේ අභිමතාර්ථය වෙයි.

02. බුද්ධ ධර්මය II ප්‍රශ්න පත්‍රයෙහි මතු දැක්වෙන උපදෙස් දී ඇත.

පළමුවන ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

★ පළමුවන ප්‍රශ්නයට ලකුණු 20 ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු 10 ක් බැගින් ද හිමි වේ.

ඒ අනුව එක් එක් ප්‍රශ්නයට කොටස්වලට ලකුණු ප්‍රදානය කිරීමේ දී දිය යුතු ලකුණු ප්‍රමාණය මතකයෙහි තබා ගත යුතුය. පළමුවන ප්‍රශ්නයට ලකුණු (10 x 2) 20 කි. සෙසු ප්‍රශ්නවල i කොටසට ලකුණු 2 ක් ද, ii කොටසට ලකුණු 3 ක් ද, iii කොටසට ලකුණු 5 ක් ද වශයෙන් ලකුණු 10 බැගින් හිමිවේ. ඒ අනුව II පත්‍රයට ලකුණු (20 + 10 x 4) 60 කි.

03. බුද්ධ චරිතය, ශ්‍රාවක ශ්‍රාවිකා චරිත, බෞද්ධ චරිත කථා, බෞද්ධ ධර්මය, බෞද්ධ සමාජය, බෞද්ධාගමික චාරිත්‍ර, බෞද්ධ රාජ්‍ය පාලන මූලධර්ම, බෞද්ධ සාහිත්‍ය හා කලාශිල්ප, බෞද්ධ ශාසන ඉතිහාසය, ලක්දිව බුදුසසුන ආදිය පිළිබඳ විෂය නිර්දේෂයට අදාළ කරුණු සම්බන්ධ සාමාන්‍ය ඥානය, විශේෂ ඥානය හා ප්‍රායෝගික අවබෝධය පරීක්ෂා කර බැලීම මේ ප්‍රශ්න පත්‍රයෙන් බලාපොරොත්තු වනු ලැබේ.

දෙවන පත්‍රයේ අංක 1 ප්‍රශ්නය ඉදිරිපත් කොට ඇත්තේ බුද්ධ ධර්මය මූලික විෂය කරුණු කෙටියෙන් ලියා දක්වීම සඳහා කෙටි ප්‍රශ්න 10 කින් සමන්විත ප්‍රශ්නයක් ලෙසය. එහි දී ශිෂ්‍යයාහට නම් කිරීමක්, අර්ථ දක්වීමක්, කෙටියෙන් හැඳින්වීමක් වැනි ප්‍රජානන හැකියා ලියා ඉදිරිපත් කිරීමට සිදුවේ. හිමි ලකුණු 20 කි. අංක 2 සිට 7 දක්වා ප්‍රශ්නවල i කොටසින් විෂයට අදාළ මූලික කරුණු පිළිබඳ අපේක්ෂකයා සතු දැනුම පරීක්ෂාවට ලක්කෙරෙයි. ii කොටසින් ඒ හා සම්බන්ධ කරුණු විග්‍රහ කොට ඇති අයුරු අපේක්ෂකයා මනාව වටහාගෙන ඇත්දැයි විමසුසට ලක්කෙරේ. iii කොටසින් අදාළ විෂය සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ විචාරාත්මක අවබෝධය හා නිදහස් චින්තනය පරීක්ෂාවට ලක් කරනු ලැබේ.

මෙම කොටස් තුනෙන් iii කොටසට සපයා ඇති පිළිතුරු බොහෝවිට ගැඹුරු නොවීමට පුළුවන. එහෙත් අසා ඇති ප්‍රශ්න නිවැරදිව වටහා ගෙන අර්ථවත් කරුණු ඉදිරිපත් කර තිබේ නම් පිළිතුර කෙටි වුවද සාධාරණ ලකුණු ප්‍රමාණයක් දීම සුදුසුය.

04. ශිෂ්‍යයා නිවහල් චින්තනයට යොමු කිරීම නූතන අධ්‍යාපන ක්‍රියාවලියේ ප්‍රධාන පරමාර්ථය ලෙස සලකනු ලැබේ. එබැවින් බුද්ධ ධර්මය II ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමේදී අදාළ පාඨ ග්‍රන්ථයනහි අන්තර්ගතයටම වහල් නොවී ස්වාධීනව ඉදිරිපත් කර ඇති නිවැරදි කරුණු පිළිබඳ ඔබේ අවධානය යොමු කිරීම මැනවි.

Scanned with CamScanner

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2015

II - බුද්ධ ධර්මය
අවසාන ලකුණු ගණනය කිරීම

I පත්‍රය : බහුවරණ ප්‍රශ්න 40 කි = (40 x 1) ලකුණු 40 යි

II පත්‍රය: 1 වැනි ප්‍රශ්නය කොටස් 10 කි කෙටි පිළිතුරු (10 x 2) ලකුණු 20 යි

2 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 ලකුණු 10 යි.

3 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 ලකුණු 10 යි.

4 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 ලකුණු 10 යි.

5 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 ලකුණු 10 යි.

6 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 ලකුණු 10 යි.

7 වැනි ප්‍රශ්නය
- i ලකුණු 2
- ii ලකුණු 3
- iii ලකුණු 5 ලකුණු 10 යි.

ලකුණු 60 යි.
මුළු ලකුණු 100 යි.

පළමු සහ දෙවන පත්‍රවල ලකුණු දැමීම
පළමු පත්‍රයේ සිදුරුපත් මගින් වැරදි ලකුණු කිරීමේ දී අදාළ ප්‍රශ්න අංකය ඉදිරියේ හරි වැරදි ලකුණු කරන්න.
නිවැරදි ලකුණු ගණනය කොට අදාළ පේළිය යට කොටුවෙහි මුළු සංඛ්‍යාව සටහන් කරන්න.

දෙවන පත්‍රයේ කොටස් ලකුණු දකුණු පස ඇති තීරුවේ ලියා දක්වන්න.
එක් එක් ප්‍රශ්නයේ කොටස්වලට ලද ලකුණු උත්තරයේ අග ලියා එකතු කොට එය දකුණු පස තීරුවේ ලියා ඒ වටා රවුමක් අඳින්න

උදා : i. $\frac{2}{2}$ ii. $\frac{2}{3}$ iii. $\frac{2}{5}$ = $\frac{06}{10}$

Scanned with CamScanner

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

රහස්‍යයි

අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2015
க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2015

විෂයය අංකය
பாட இலக்கம் 11

විෂයය
பாடம் බුද්ධ ධර්මය

I පත්‍රය - පිළිතුරු
I பத்திரம் - விடைகள்

ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.	ප්‍රශ්න අංකය வினா இல.	පිළිතුරු අංකය விடை இல.
01.	04	11.	04	21.	02	31.	04
02.	01	12.	03	22.	04	32.	02
03.	03	13.	02	23.	03	33.	03
04.	02	14.	01	24.	03	34.	01
05.	02	15.	03	25.	02	35.	02
06.	02	16.	04	26.	03	36.	04
07.	03	17.	02	27.	02	37.	01
08.	03	18.	01	28.	03	38.	02
09.	03	19.	01	29.	03	39.	02
10.	01	20.	03	30.	03	40.	04

විශේෂ උපදෙස්
விசேட அறிவுறுத்தல்

එක් පිළිතුරකට ලකුණු
ஒரு சரியான விடைக்கு **01** බැගින්
புள்ளி வீதம்

මුළු ලකුණු / மொத்தப் புள்ளிகள் **01 × 40 = 40**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

නිවැරදි පිළිතුරු සංඛ්‍යාව
சரியான விடைகளின் தொகை **25**

I පත්‍රයේ මුළු ලකුණු
பத்திரம் I இன் மொத்தப்புள்ளி **25**

Scanned with CamScanner

II වන පත්‍රය

01. (i) **බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනය ලෙස ප්‍රකට සූත්‍රයේ නම කුමක් ද?**

ධම්මචක්කපවත්තන සුත්‍රය/දම්සක් පැවතුම් සූත්‍රය

(ලකුණු 02)

(ii) **බුදුදහමේ ඉගැන්වෙන ප්‍රධාන භාවනා ක්‍රම දෙක කවරේ ද?**

I. සමථ භාවනාව/සමාධි භාවනාව/චිත්ත භාවනාව
II. විදර්ශනා භාවනාව/විපස්සනා භාවනාව/ප්‍රඥා භාවනාව/ ත්‍රිලක්ෂණ භාවනාව

එක් කරුණකට ලකුණ බැගින් ලකුණු දෙන්න

(ලකුණු 02)

(iii) **'යො ධම්මං පස්සති සො පටිච්චසමුප්පාදං පස්සති" මෙම පාඨයේ අදහස ලියන්න.**

යමෙක් ධර්මය දකියිද හෙතෙම පටිච්චසමුප්පාදය දකියි/ ධර්මය දකින්නා පටිච්චසමුප්පාදය දකියි.

(ලකුණු 02)

(iv) **සිවු බඹ විහරණ ලියා දක්වන්න.**

I. මෙත්තා/මෛත්‍රිය
II. කරුණා
III. මුදිතා
IV. උපෙක්ඛා (උපේක්ෂා) / මැදහත්බව

එක් කරුණකට ලකුණු ½ බැගින් ලකුණු දෙන්න

(ලකුණු 02)

(v) **"නහි වෙරෙන වෙරානි - සම්මන්තීධ කුදාචනං**

අවෙරෙන ච සම්මන්ති - එසධම්මෝ සනන්තනෝ" මෙම ගාථාවේ අදහස ලියන්න.

මේ ලෝකයේ වෛරය කිසිකලෙකත් වෛරයෙන් නොසංසිඳේ. අවෛරයෙන්ම සංසිඳේ. මෙය සනාතනික (සදාකාලික) දහමකි.

මේ අදහස ඇතුළත් පිළිතුරට ලකුණු දෙන්න

(ලකුණු 02)

(vi) **ත්‍රිලක්ෂණය නම් කරන්න.**

අනිත්‍ය
දුක්ඛ
අනාත්ම

කරුණු 02 කට ලකුණයි. කරුණු 03 ට ලකුණු දෙකයි.

(ලකුණු 02)

Scanned with CamScanner

(vii) ජාතක කථා පාඨක කොට කෝට්ටේ යුගයේ දී ලියැවුණු කාව්‍ය ග්‍රන්ථ **දෙකක්** ලියා දක්වන්න.

I. කාව්‍යශේඛරය
II. ගුත්තිල කාව්‍යය
එකකට ලකුණ බැගින් දෙන්න.

(ලකුණු 02)

(viii) බුදුදහමේ දැක්වෙන පරිදි සිත කිලිටි කරන අකුසල මූල **තුන** නම් කරන්න.

I. ලෝභ
II. දෝස
III. මෝහ

කරුණු 02 කට ලකුණු 01 යි. කරුණු 03 ට ලකුණු 02 යි.

(ලකුණු 02)

(ix) අනුරාධපුර යුගයේ රාජ්‍ය පාලකයින් දෙදෙනකු වූ වළගම්බා සහ මහසෙන් යන රජවරුන් විසින් ඉදි කළ ස්තූප **දෙකේ** නම් ලියන්න.

I. වලගම්බා රජු - අභයගිරි ස්තූපය
II. මහසෙන් රජු - ජේතවන ස්තූපය

(රජවරුන් නම් නොකොට ස්තූප පමණක් නම්කොට ඇත්නම් අනුපිළිවෙළ සලකා ලකුණු දෙන්න)

(ලකුණු 02)

(x) සතර සතිපට්ඨාන ලියා දක්වන්න.

I. කයානුපස්සනා / කය පිළිබඳ මෙනෙහි කිරීම
II. චිත්තානුපස්සනා / සිත පිළිබඳ මෙනෙහි කිරීම
III. වේදනානුපස්සනා / වේදනාවන් පිළිබඳ මෙනෙහි කිරීම
IV. ධම්මානුපස්සනා / ධර්මයන් පිළිබඳ මෙනෙහි කිරීම

එක් කරුණකට ලකුණු ½ බැගින් දෙන්න

(ලකුණු 02)

02. (i) සිදුහත් කුමරු දුටු සතර පෙර නිමිති මොනවා ද?

I. මහල්ලෙක්/වයසට ගිය අයෙක්
II. ලෙඩෙක්/රෝගියෙක්
III. මළකඳක්/මියගිය අයෙක්
IV. ශ්‍රමණරූපයක් / පැවිද්දෙක්

එක් කරුණකට ලකුණු ½ බැගින් ලකුණු ලබාදෙන්න

(ලකුණු 02)

Scanned with CamScanner

(ii) **මහා අභිනිෂ්ක්‍රමණයේ සිට බුද්ධත්වය දක්වා සිදුහත් සිරිතේ ප්‍රධාන සිදුවීම් ලියන්න.**

- ඇසළ පුන්පොහෝ දින සිදුහත් කුමරු ජන්න ඇමති සමඟ කන්ථක අසුපිට නැඟී රජ මාලිගයෙන් නික්මීම.
- තිස්යොදුන් මඟගෙවා අනෝමා ගංතෙරට පැමිණ ඉන් එතෙරවීම.
- ඝටීකාර බ්‍රහ්මයාගේ අෂ්ටපරිෂ්කාර පූජාව.
- මගුල් කඩුවෙන් හිසකෙස් කපා රාජාභරණ මුදා කසාවත් හැඳ පැවිදිවීම.
- අනෝමා ගඟ අසබඩ අනුපිය අඹ වනයෙහි සතියක් විවේක සුවයෙන් ගත කිරීම.
- රජගහනුවර පිඬුසිඟා වැඩීම.
- පාණ්ඩව පර්වත පාමුලදී බිම්බිසාර රජතුමා මුණගැසීම හා ප්‍රතිඥාවක් දීම.
- භාර්ගව තවුසාගේ අසපුවට පැමිණ ඔහුගේ ධර්මය හැදෑරීම.
- ආලාරකාලාම හා උද්දකාරාමපුත්ත තවුසන් වෙත එළඹ ඔවුන්ගේ ධර්මයන් හැදෑරීම හා ධ්‍යාන උපදවා ගැනීම.
- උරුවෙල් දනව්වෙහි සේනානි නියම්ගම නේරංජා නදී තීරයේ දී ශරීරයට දැඩි සේ දුක් දෙමින් උග්‍ර තවුස්දම් පිරීම සහ පස්වග තවුසන්ගේ උපස්ථාන ලැබීම.
- උග්‍ර තවුස්දම් පිරීම (ශරීරයට අධික දුක් දීම) නිසරුබව අවබෝධ කොට මැදුම් පිළිවෙත අනුගමනය කිරීම.
- සුජාතා සිටු දියණියගේ කිරිපිඬු වැළඳීම.
- සොත්තිය බමුණා පිළිගැන්වූ කුසතිණ අතුරා ඒ මත චතුරංග සමන්නාගත වීර්යයෙන් යුතුව වැඩ හිඳීම.
- පෙරයම පුබ්බේනිවාසානුස්සති ඥානයද, මැදියම චුතූපපාත ඥානය ද අලුයම ආසවක්ඛය ඥානය ද අවබෝධ කොට සම්මා සම්බුද්ධත්වයට පත්වීම.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු දෙන්න.

(ලකුණු 03)

(iii) "ළමා අවධියේ සිට ම පරාර්ථකාමී වීම ජීවිතයට අත්‍යවශ්‍ය ගුණයකි." බුදු සිරිත ඇසුරෙන් මෙය සාකච්ඡා කරන්න.

- දම්සක් පැවතුම් සූත්‍ර දේශනාවෙන් අනතුරුව ප්‍රථම රහත් හැටනම ධර්ම ප්‍රචාරය සඳහා පිටත් කර යැවීම. (චරථ භික්ඛවේ චාරිකං බහුජනහිතාය බහුජන සුඛාය)
- තුරිත චාරිකා හා අතුරිත චාරිකා මගින් අන්‍යන්ට උදව් කිරීම (පුක්කුසාති, රජ්ජුමාලා, සුනීත, සෝපාක, ආදීන්ට පිහිටවීම)
- බුදුරජාණන් වහන්සේගේ දින චර්යාව.

පෙරබත් කිස
පසුබත් කිස
} දිවා කාලය

පෙරයම් කිස
මැදියම් කිස
අලුයම් කිස
} රාත්‍රි කාලය

Scanned with CamScanner

- විවේකය සිමිතව ලබා ගැනීම හා පරාර්ථ චර්යාවට මුළු ජීවිතයම කැප කිරීම.

- පරිනිර්වාණ මොහොතේ පවා පරාර්ථ චර්යාවට යොමුවීම. (තමාට ගැටලුවක් වේ නම් නොපමාව විමසන ලෙසත් තමාට නොහැකි නම් තම මිතුරෙකු මගින් හෝ විමසන ලෙසත් දැන්වීම.

බුදු සිරිතෙහි මෙවන් උදාහරණ 03 ක් වත් යොදා ගනිමින් ළමා අවධියේ සිටම පරාර්ථකාමී වීම විස්තර කොට තිබීම අපේක්ෂිතය.

(ලකුණු 05)

03. (i) "ඇසුරු කිරීමට තමන්ට වඩා උසස් අයකු හෝ සමාන අයකු හෝ නොමැති නම් හුදෙකලාව වාසය කිරීම සුදුසු මේ බව අවධාරණය කෙරෙන ධම්මපද ගාථාව ලියන්න.

I. චරං චේ නාධිගච්ඡෙය්‍ය
සෙය්‍යං සදිසමත්තනො
ඒකචරියං දළ්හං කයිරා
නත්ථි බාලේ සහායතා

ගාථාව සම්පූර්ණව ලියා ඇත්නම් ලකුණු දෙන්න. අක්ෂර වින්‍යාසය නොසලකන්න.

(ලකුණු 02)

(ii) එම ගාථාවේ දැක්වෙන 'බාලයා' යනු කවුරුන් දැයි පැහැදිලි කරන්න.

- මෙම ගාථාවේ සඳහන් බාලයා යනු ගුණානුවණින් තොර තැනැත්තායි. වැනම් නපුරු සිතිවිලි ඇති නපුරු වචන කථා කරන නපුරු වැඩ කරන පුද්ගලයායි. ගුණාදහමින් තොර අඥාන පුද්ගලයායි. එවැනි පුද්ගලයන් ඇසුරු නොකළ යුතු බව දැක්වේ.

මෙවැනි අදහස් ඇති පිළිතුරක් පූර්ණ පිළිතුරක් ලෙස සලකන්න

(ලකුණු 03)

(iii) ජීවිතය සාර්ථක කර ගැනීමට ධම්මපදයෙන් ඔබට ලැබෙන උපදෙස් ඇගයීමට ලක් කරන්න

- ගෘහ ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය උපදෙස් සපයන ග්‍රන්ථයක් ලෙස ධම්මපදය ඇගයීමට ලක් කළ හැකිය. තම ජීවිතය අයහපතින් මුදවා යහපතෙහි යෙදවීමට අවශ්‍ය මග පෙන්වීම් ධම්මපදයෙහි ඇතුළත් වේ. මානසික අසහනයක්, ගැටලුවක් ඇති වූ විටෙක කම්පාවට පත් නොවී ධෛර්ය සම්පන්නව තම ජීවිතය පවත්වා ගැනීමට අවශ්‍ය උපදෙස් ධම්මපදයෙන් සපයයි. ජාති ආගම් ආදී කිසිදු භේදයකින් තොරව මනුෂ්‍ය වර්ගයාගේ ජීවිත සාර්ථක කර ගැනීමට අවශ්‍ය මාහැඟි උපදෙස් ධම්මපදයේ ඇතුළත් වේ.

ගාථා පාඨ උදාහරණ කිහිපයක් ඇසුරින් ලියා ඇති පිළිතුරකට සම්පූර්ණ ලකුණු දෙන්න.

ගාථා තුනේ 3 ක් වත් සඳහන් කළ යුතුය.

(ලකුණු 05)

04. (i) ආර්ය සත්‍යය හතර නම් කරන්න.

I. දුක්ඛ ආර්ය සත්‍යය/දුක
II. දුක්ඛ සමුදය ආර්ය සත්‍යය / දුකට හේතුව
III. දුක්ඛ නිරෝධ ආර්ය සත්‍යය / දුක නැති කිරීම
IV. දුක්ඛ නිරෝධ ගාමිනී පටිපදා ආර්ය සත්‍යය / දුක නැති කිරීමේ මග

දුක්ඛ, සමුදය, නිරෝධ, මාර්ග යනුවෙන් ලියා තිබුණ ද ලකුණු දෙන්න.
එක් කරුණකට ලකුණු ½ බැගින් ලකුණු දෙන්න

(ලකුණු 02)

Scanned with CamScanner

(ii) **"සම්මා වාචා" යන්න ධර්මානුකූල ව පැහැදිලි කරන්න.**

සම්මා වාචා යනු නිවැරදි වචනයයි. බොරු කීම, කේලාම් කීම. පරුෂ වචන කීම, හිස් වචන කීම (මුසාවාදා, පිසුණා වාචා, පරුසා වාචා, සම්පප්පලාපා) යන වචනයෙන් සිදුවන වැරදිවලින් වැළකී සත්‍ය වූ, අනුන් අතර සමගිය වඩන, මෘදු, අර්ථවත් වචන භාවිතයයි.

මූලික කරුණු ඇතුළත් පිළිතුරකට සම්පූර්ණ ලකුණු දෙන්න. සම්මා වාචා යනු නිවැරදි වචනයයි. යන්න පමණක් ලියා ඇත්නම් ලකුණක් දෙන්න.

(ලකුණු 03)

(iii) **මධ්‍යම ප්‍රතිපදාව ජීවිත කාලය තුළ දී ම සැනසීම ලබා දෙන මාර්ගයක් බව පෙන්වා දෙන්න.**

මධ්‍යම ප්‍රතිපදාව යනු කාමසුඛල්ලිකානුයෝගය සහ අත්තකිලමතානුයෝගය යන අන්ත දෙකින් බැහැර වීමයි.

- අන්තගාමී පිළිවෙත් මගින් කායික, මානසික සැනසිල්ල අහිමි වේ.
- කායික වශයෙන් රෝගාබාධයන්ට ද මානසික වශයෙන් අතෘප්තිකර ආශාවන්ට ගොදුරුවීම මගින් විවිධ සමාජ ගැටලු ද ඇතිවේ.
- මැදුම් පිළිවෙතෙහි දැක්වෙන අංග මගින් පෞද්ගලික මෙන්ම සමාජ ජීවිතයද යහපත් බවට පත් කෙරේ.
- සමාජ ජීවිතයේ සැනසීම ලැබීම හා බෞද්ධයෙකු ලෙස සදාකාලික සැනසිල්ල ලෙස අපේක්ෂිත ආර්ය මාර්ගයට ප්‍රවේශ වීම.
- කායික, වාචසික හා මානසික සුචරිතය මගින් මුළු ජීවිත කාලය පුරාම සැනසිල්ල ලැබෙන බව.

මෙසේ මධ්‍යම ප්‍රතිපදාව (ආර්ය අෂ්ටාංගික මාර්ගය) තුළින් සාදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගෙන බවත් ඒ නිසාම ජීවිතය සැනසිලිදායක එකක් බවට පත්වන අයුරු පෙන්වාදී තිබීම ප්‍රමාණවත්ය.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු ලබාදෙන්න.

(ලකුණු 05)

05. (i) **ශ්‍රී ලංකාවේ බෞද්ධ පාසල් ආරම්භ කිරීමට, සර් හෙන්රි ස්ටීල් ඕල්කට්තුමන් විසින් ගත් පියවර හඳුන්වන්න.**

- ඕල්කට්තුමා ශ්‍රී ලංකාවට පැමිණ බුදුදහම වැළඳ ගැනීම.
- පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවීම
- මහජනතාව දැනුවත් කිරීම මගින් බෞද්ධ පුනරුදයක් ඇති කිරීම.
- ආනන්ද, ධර්මරාජ, මහින්ද වැනි පාසල් පිහිටුවීමට කටයුතු යෙදීම.

මූලික අදහස ඇතුළත් පිළිතුරකට ලකුණු දෙන්න.

(ලකුණු 02)

Scanned with CamScanner

(ii) ඩෙවිඩ් හේවාවිතාරණ තරුණයා අනගාරික ධර්මපාල බවට පත් වූ අයුරු දක්වන්න.

- ඩෙවිඩ් හේවාවිතාරණ මිෂනාරි අධ්‍යාපනය ලැබුවෙකි.
- මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි හා හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි ඇසුරට පත්ව බුද්ධ ධර්මය, සිංහල හා පාලි භාෂාවන් පිළිබඳ හසල දැනුමක් ලැබීය.
- මිල්කට්තුමාගේ භාෂා පරිවර්තකයා ලෙස කටයුතු කිරීමේ දී ස්වදේශීය හැඟීම තවතවත් වර්ධනය කර ගත් ඩෙවිඩ් තරුණයා, සිංහලයාගේ පිබිදීම ඇති කරනු සඳහා කැපවිය.
- සිංහල ගති සිරිත් ඉහළ මට්ටමකින් පවත්වා ගැනීමට ආදර්ශයක් තමා වෙතින්ම ලබා දීම සඳහා තමාගේ නම වූ ඩෙවිඩ් යන්න ධර්මපාල වශයෙන් වෙනස්කර ගත්තේය.
- ජීවිතකාලයම අවිවාහකව (බ්‍රහ්මචාරීව) ගත කළ නිසා අනගාරික ධර්මපාල නමින් හඳුන්වනු ලැබිණ.

මූලික අදහස ඇතුලත් පිළිතුරට ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 03)

(iii) "මානසික වසල්භාවය නමැති අන්ධකාරයේ නිමග්නව සිටි සිංහල බෞද්ධයන්ට ආලෝකය සැපයූ ප්‍රදීපස්තම්භයක් ලෙස ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමා හැඳින්විය හැකි ය." මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

- අනගාරික ධර්මපාලතුමන් උපන් සමයෙහි රජයේ හෝ බෞද්ධ පාසල් නොතිබුණු බැවින් මිෂනාරි ක්‍රිස්තියානි අධ්‍යාපනය ප්‍රචලිතව පැවතීම.
- රැකීරක්ෂා ලබා ගැනීමේ දී එවකට වැඩි සැළකිලි ලැබුණේ ඉංග්‍රීසි උගත් ක්‍රිස්තු භක්තිකයන්ට පමණක් වීම.
- එවකට සිංහල භාෂාව, බුදු දහම, දේශීය සිරිත් විරිත්, ඇඳුම් පැළඳුම් ප්‍රතික්ෂේප කොට යුරෝපීය සිරිත් විරිත්, ඇඳුම් පැළඳුම් නම් ගම් භාවිත කිරීම.
- මිගෙට්ටුවත්තේ ගුණානන්ද ස්වාමීන්වහන්සේගේ දේශන වලට සවන් දී මිෂනාරි බලය හා අසාධාරණකම්වලට එරෙහිව ජනතාව දැනුවත් කිරීම/දේශන පැවැත්වීම සහ පෙළ සිරිත් විරිත් හා ආර්ය නම් ගම්වල අගය පහදා දීම.
- දේශීය කර්මාන්ත නගා සිටුවීමට උනන්දු කරවීම.
- "පරාධීන භාවයෙන් මිදීමට අපේ ජාතික අවශ්‍යතාවන් අපරට තුළින්ම සපුරාගත යුතුය." වැනි අදහස් ප්‍රචලිත කිරීමට උත්සාහදැරීම.

මෙවන් කරුණු ඇතුළත්ව ලියා ඇති පිළිතුරු සඳහා සමස්තය සලකා ලකුණු දෙන්න.

(ලකුණු 05)

06. (i) තෙවැනි ධර්ම සංගායනාව පැවැත්වීමට තුඩුදුන් හේතු මොනවා ද?

- ලාභාපේක්ෂාවෙන් දුර්මතධාරීන් බුදු සසුනට එකතුවීම.
- දුර්මතධාරීන් නිසා සිල්වත් භික්ෂූන්වහන්සේලාට පොහොය (විනය) කම් සිදුකිරීමට බාධා ඇතිවීම.
- ධර්ම විනය විධිමත්ව පවත්වා ගැනීම.

(ලකුණු 02)

Scanned with CamScanner

(ii) **තෙවැනි ධර්ම සංගායනාව සම්බන්ධ ව අසා ඇති පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

* **සංගායනාව සඳහා මූලිකත්වය ගෙන ක්‍රියා කළ රහතන් වහන්සේ කවු ද?**
* **සංගායනාවට අනුග්‍රහය ලබා දුන් රාජ්‍ය පාලකයා කවු ද?**
* **සංගායනාව පැවැත් වූ ස්ථානය නම් කරන්න.**

- මොග්ගලීපුත්තතිස්ස මහරහතන් වහන්සේ
- ධර්මාශෝක අධිරාජයා.
- පැළලුප්නුවර අශෝකාරාමයේ දී.

එක් කරුණකට ලකුණු 01 බැගින් ලකුණු දෙන්න

(ලකුණු 03)

(iii) **තෙරවාද බුදුදහමේ දේශාන්තර ව්‍යාප්තිය සඳහා තෙවැනි ධර්ම සංගායනාව ඉවහල් වූ අයුරු විස්තර කරන්න.**

තෙරවාදී බුදු දහමේ දේශාන්තර ව්‍යාප්තිය සඳහා තෙවන ධර්ම සංගායනාව ඉවහල් විණි. ධර්මාශෝක අධිරාජයා තම ධර්ම විජය ප්‍රතිපත්තිය අනුව තෙරවාද බුදු දහම රටවල් නවයකට පිටත් කර යැවීය. නව රට සසුන් පිහිටුවීම යනු එයයි.

කාශ්මීර ගාන්ධාරය, මහිෂ මණ්ඩලය, වනවාසී දේශය, අපරත්න දේශය, මහාරට්ඨය, යෝනක රට්ඨ, හිමවන්ත ප්‍රදේශය, ස්වර්ණභූමිය හා තම්බපණ්ණි (ශ්‍රී ලංකාව) යන රටවල් නවයට ධර්ම දූතයින් පිටත් කර හරිනු ලැබිණි. මෙතෙක් භාරතයේ මධ්‍ය ප්‍රදේශයට පමණක් සීමා වී තිබූ තෙරවාද බුදු දහම දේශාන්තර වශයෙන් ව්‍යාප්ත වූයේ මෙම සංගායනාවේ ප්‍රතිඵලයක් වශයෙනි.

අවම වශයෙන් රටවල් පහක්වත් ඇතුළත්ව ලියා ඇති පිළිතුරකට සම්පූර්ණ ලකුණු ප්‍රදානය කරන්න.

(ලකුණු 05)

07. (i) **ඉරියවු අනුව බුද්ධ ප්‍රතිමා බෙදා දක්වන වර්ග තුන නම් කරන්න.**

1. හිඳි පිළිම
2. හිටි පිළිම
3. ඔත් (සැතපෙන) පිළිම

කරුණු 02 ට ලකුණක් ද කරුණු 03 ට ලකුණු දෙකක් ද ලෙස ප්‍රදානය කරන්න.

(ලකුණු 02)

(ii) **බුද්ධ ප්‍රතිමා නිර්මාණකරණයේ ආරම්භය හා විකාශය සිදු වූ අයුරු පහදන්න.**

බුදුරජාණන් වහන්සේ සංකේතවත් කිරීම සඳහා බුදුපිළිමයක් නිර්මාණය කිරීමට කලා ශිල්පීන් පෙළඹුනේ කලක් ගතවූ පසුවය. ඒ වෙනුවට බෝධිය, ධර්ම චක්‍රය, ආසනය වැනි සංකේත භාවිත කොට ඇත. ක්‍රි.ව. පළමුවන සියවසේ කණිෂ්ක රජතුමාගේ කාලයේ ගන්ධාරයේ දී ග්‍රීකරෝම කලා ශිල්පීන්ගේ අභාසයෙන් මුල්ම බුදු පිළිමය නිර්මාණය කරන්නට ඇතැයි සැලකේ. බුදු පිළිමය මථුරාවෙහි දී පළමු ව නිර්මාණය කරන්නට ඇතැයි තවත් මතයකි. ක්‍රි.පූ. 3වන සියවසේ දෙවන පෑතිස් රජතුමා ථූපාරාමයේ ශිලාමය බුද්ධ ප්‍රතිමාවක් පිහිට වූ බව මහාවංශයේ දැක්වේ.

Scanned with CamScanner

කෝසල බිම්බ වර්ණනාවට අනුව, බුදුරජාණන් වහන්සේ ජීවමාන සමයේ දීම කොසොල් රජතුමා සඳුන් ලීයෙන් බුද්ධ ප්‍රතිමාවක් කරවූ බව දැක්වේ.

මෙලෙස ආරම්භ වූ බුදු පිළිම නිර්මාණය ශ්‍රී ලංකාව ඇතුලු වෙනත් රටවලද සිදුවිය. විවිධ ඉරියව් අනුව විශිෂ්ට කලා නිර්මාණයක් ලෙස බුදු පිළිම නෙලා ඇති බව පැහැදිලිය.

මේ කරුණු ආශ්‍රයෙන් ලියු පිළිතුරකට සම්පූර්ණ ලකුණු දෙන්න.

(ලකුණු 03)

(iii) **බුදුරජාණන් වහන්සේගේ ආධ්‍යාත්මික ගුණ ප්‍රකට වන අයුරෙන් ශ්‍රී ලාංකික කලා ශිල්පීන් බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ යෙදී ඇති අයුරු නිදසුන් ඇසුරෙන් විස්තර කරන්න.**

බුදුරජාණන් වහන්සේගේ ආධ්‍යාත්මික ගුණ ප්‍රකට වන අයුරින් ශ්‍රී ලාංකික කලා ශිල්පීන් බුද්ධ ප්‍රතිමා නිර්මාණයෙහි යෙදුනු ආකාරය ප්‍රකට වේ. බුදුරජාණන් වහන්සේ තුළ වූ මහා කරුණාව මහා ප්‍රඥාව ආදී ශ්‍රේෂ්ඨ ගුණ සමුදායන් නිරූපණය කරමින් බුදුපිළිම නෙලා ඇත. අනුරාධපුරයෙහි සමාධි ප්‍රතිමාව, අවුකන, මාඵිගාවිල හිටි පිළිම, පොළොන්නරුවේ ගල් විහාරයෙහි හා තන්තිරිමලේ සැතපෙන පිළිම ශ්‍රී ලාංකේය කලා ශිල්පීන්ගේ විශිෂ්ට කලා කුසලතාව පෙන්නුම් කරන නිර්මාණ වේ.

පිළිතුර සමස්තයක් ලෙස සලකා ලකුණු විනිශ්චය කරන්න. (ලකුණු 05)

Scanned with CamScanner

සටහන

Scanned with CamScanner